# කළමනාකරණයෙන්, විශ්‍රාන්තියෙන් ගොඩනගා ගත් ජීවිත

ඩී. එම්. ඩී. එල්. සේනාරත්න

සුනන්දා විජයලතා මුණසිංහ නම් ගත් කතුවරිය විසින් රචනා කරන ලද කුරුටු ගෑ ගී නම් නවකථාව, වර්ෂ 1920 වන විට ඉදිරියට තිබුණු වකවානුව මෙන්ම එදා තිබූ ගැමි පරිසරය, කතාබහ, ආකල්ප අනුසාරය කොටගෙන ගොඩනැගුනකි. කළමනාකරණය, විශාන්ත්‍රිය යන අංග තම ජීවිතය කරගත් ගැමි පවුලක් වටා ගෙතුණු කථාවක් කුරුටු ගෑ ගී නවකථාව තුලින් විදහා දක්වයි. පිටු 268කින් හා සමන්විතය.

මියගිය තම මව වෙනුවෙන් පිං දහම් කිරීමත්, ඇයගේ නමට අගෞරවයක් නොවන ලෙස ජීවත් වීමත්, සහෝදරිය හා සහෝදරයන් දෙදෙනා රැකබලා ගැනීමටත්, පියාට සාත්තු කිරීමත් මිස මෙරායාට වෙනත් කිසිම දෙයක් අවශ්‍ය නැත. "අන්න හරි පොඩි නංගි සල්ලි පරිස්සම් කරන්නෙ ඔහොම තමයි. කවුද අතන මෙතන කාසි දාන්නේ....? ඒවා හදිස්සියකට ගන්න ඉතුරු කරගන්න ඕනා." දිනපතාම පන්සලට ගොස් මල් පූජා කර තම සහෝදර හාමුදුරුවන් ද මුණ ගැසී දවසේ තොරතුරු දන්වා ඒමත් ඇයගේ ජීවිතයේ එක් අංගයක් විය. "ඔව් මං තාත්තාවත් බල බල තමයි කවි පාඩම් කළේ." "හා..... හා..... පලයන් පලයන් උඹ කවි පාඩම් කරපන්." මුළු ගෙයි පුරා තිබෙන පාළුව දුරු කරමින් කැරලිනා ලොවැඩ සඟරාවේ කවි තාලයට කියනවාත් සමගම..... හවස මල් පහන් පූජා කළ සුවඳ පන්සල් භූමිය පුරා පැතිරී යනු දැනේ. මෙවන් ශාන්ත පරිසරයක ජීවත් වීමට ලැබෙන විට සිත එකවරම සන්සුන් වන බව ඩේවිඩ් අවබෝධ කර ගත්තේය. කෙල්ලෝ එක්ක වලකජු ගහනවා මිසක් වෙන රාජකාරියක් කරනවැයැ. මේධානන්ද හාමුදුරුවෝ ඩේවිඩ් සමග බෝ මළුව ආසන්නයට පැමිණ සක්මන් කරමින් කතා කරන්නට වූහ. ඩේවිඩ් සහ බුරම්පි සිංඤෝ එකට දුව පැන ගෙයි පුරා දඟලමින් නැටූ හැටි සුරතල් බලමින් පුරන්සිනා සමග පොඩිඅප්පුහාමි ජීවත් වූයේ..... මිදුල රටාවකට අතු ගායි. කොස් දෙල් වේලයි. උන්වහන්සේ දේශනා කරන බණ අසන්නට හැම පෝය දිනකම ගම්වාසීන් පමණක් නොව දුර පළාත්වලින් ද සෙනග පැමුණුනහ. දිගටම ජ්‍යෝතිෂ ශාස්ත්‍රය ඉගෙන ගැනීමට කැරලිනාට තදබල ආශාවක් ඇති කළාය. මොහොතින් අල්ලපු ගේ පැත්තෙන් කැකිරි පැලෙන සිනා හඬක් ඇසිණි. පොඩිඅප්පුහාමිගේ තුන් මාසේ දානයෙන් පසු මෙරායාගේ මංගල කටයුතු සූදානම් වුයේ නෑදෑ හිත මිත්‍රාදීන්ගේ සහයෝගයෙනි. ඉතාමත් සීමිත නෑදෑ හිතවතුන්ගෙන් පිරුණ මිල්ල ගහ වත්තේ චාම්ව නමුත් අනර්ඝතම අන්දමට සිදුවූ මංගල්‍යයක් වෙනත් කිසිදාක නොවූ අයුරින් සිදු කෙරිණි. ...කොණ්ඩ කැවුමේ කොණ්ඩය අපූරුවට ගන්නා ගමන්ය. "අපූරුවට හිටීව් උන් ඔය ගෙවල්වල එක්ක ගියොත් ආතර්ගේ ගෑනිත් ඕපදූප මල්ල." කට තියෙන පලියට බොරු බේගල් දොඩවලා සැනසෙනවානෙ."ඒ තොවිලෙ බලන්න මුළු ගමම උඹලැ ගෙදර" ටික කලකින් කැරලිනා අතින් ක්‍රියා කරවන මහන මැෂිමක් මිලදී ගත්තාය. ඇලඩිං අක්කා බුලත් කෑමට අර අඳින ගමන් අසල ඇති පුටුවකට බර දුන්නාය. එහෙනම් ඉතින් බෝධි පූජාවක් තියන්න වෙයි නේද...?අක්කේ..... අසාධාරණයක් නැතුව සල්ලි හම්බ කරන මිනිහෙකි. අනික හරි හම්බ කරගත් දේවල් සේරම සාධරණ දේවල් වලට තමා වියදම් කරනිනේ පොල් අතු වියයි. මළු පැදුරු වියයි. කොස් ගස් කීපයකින් සෙවණ වූ මිදුල පුරාවට වැටී ඇති කොළ ප්‍රමාණය උල් කරන ලද කෝටුවකින් ඇන ඇන රොඩු ගොඩට ගිහින් දමයි. සිය නිවසට ගැටුවේ වියමින් සිටි පැදුර රැගෙන විත් කරලිනාගේ ගෙයි පැත්තක තබාගෙන වියන්නටය. කුඩා අවධියේ දී තමා සමග එකට සෙල්ලම් කළ හැටි තමාට මතකය. "බලහං... නංගියේ උඹත් එක්ක වලකජු තරගෙට ගහපු එකා අද ගිහින් ඉන්න දුර" ඔහුගේ මෙම නොබසිනා වීරත්වය මෙතෙක් කිසිවෙකුට දුර්වල කිරීමට අපහසු කාර්යයක් විය. බුදුරජාණන් වහන්සේ වදාල පරිදි ධනය රැස් කළ යුත්තේ බාහු බලයෙන් දාඩිය මහන්සියෙනි. එය පුද්ගල ධාර්මිකතාවයට මෙන්ම සමාජ සංරක්ෂණයට ද හේතුවන්නකි.

ඔවුන් නොසිතා ජීවිතය ගොඩනගා ගන්නේ කළමනාකරණය තුළින්ය. කළමනාකරණය යන වචනය ඔවුන් නොදන්නවා වුවද ජීවිතය ගොඩනගා ගන්නේ ඒ තුළින්ය. විශාන්ත්‍රිය යන වචනයට නොදන්නවා වුව ද එයද ඔවුන්ගේ ජීවිතයේ එක් අංගයක් වී හමාරය.

මුණසිංහ සුනන්දා විජයලතා (2012), කුරුවු ගෑ ගී, සරසවි ප්‍රකාශකයෝ.